පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.06.09 පැය 0020 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1165/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු.**

## 01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - උතුරුමැද පළාත් අපරාධ විමශර්න කොට්ඨාසය.

2025.06.08 වන දින දහවල් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ පුබුදුපුර ප්‍රදේශයේදී උතුරුමැද පළාත් අපරාධ විමශර්න කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 682 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අනුරාධපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 26 ක් වන ගල්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෙරොයින් ප්‍රවාහනයට යොදා ගත් යතුරුපැදියද පොලිස් භාරයට ගෙන ඇති අතර අනුරාධපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කිරිදිවැල පොලිස් ස්ථානය.

2025.06.07 වන දින රාත්‍රී කාලයේ කිරිදිවැල පොලිස් වසමේ මයිලවලාන ප්‍රදේශයේදී කිරිදිවැල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 322 මිලිග්‍රෑම් 890 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 35 ක් වන කිරිදිවැල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදා ගත් යතුරුපැදි දෙකක් හා ජංගම දුරකථනයක්** පොලිස් භාරයට ගෙන ඇති අතර කිරිදිවැල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සහ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නිට්ටඹුව පොලිස් ස්ථානය.

2025.06.08 වන දින දහවල් කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ රදාවඩුන්න ප්‍රදේශයේදී නිට්ටඹුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 100 ක් සහ ගංජා ග්‍රෑම් 200 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 30 ක් වන රදාවඩුන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 48,000/=ක මුදලක් පොලිස් භාරයට ගෙන ඇති අතර නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කැළණිය පොලිස් ස්ථානය.

2025.06.07 වන දින රාත්‍රී කාලයේ සහ 2025.06.08 වන දින සවස් කාලයේ කැළණිය පොලිස් වසමේ කොහාල්විල ප්‍රදේශයේදී කැළණිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 975 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 370 ක්** සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 30 වයසේ පසුවන කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කැළණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. විදෙස් රටක නිෂ්පාදිත රිවොල්වර අවියක් සහ එම පතොරම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.

2025.06.08 වන දින උදෑසන කාලයේ තලංගම පොලිස් වසමේ තලවතුගොඩ ප්‍රදේශයේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදෙස් රටක නිෂ්පාදිත රිවොල්වර අවියක් හා එම පතොරම් 14 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 24 ක් වන තලවතුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. බදින කළදන් තුවක්කුවක් පත්තුවී කාන්තාවක් මියයාම - එප්පාවල පොලිස් වසම.

2025.06.08 වන දින දහවල් කාලයේ එප්පාවල පොලිස් වසමේ රොටවැව කැළෑබඳ ප්‍රදේශයේදී බදින කළදන් තුවක්කුවක් පත්තුවීමෙන් කාන්තාවක් තුවාල ලබා එප්පාවල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට එප්පාවල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 55 ක් වූ රොටවැව, එප්පාවල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය කරපිංචා කැඩීම සඳහා කැළෑබඳ ප්‍රදේශයට ඇතුළු වී ඇති අවස්ථාවේ බදින ලද තුවක්කුවක් පත්තුවීමෙන් වෙඩි වැදී මෙලෙස මියගොස් ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය එප්පාවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා එප්පාවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. හදිසි ගිනි ගැනීමක් - උඩවලව පොලිස් වසම.

2025.06.08 වන දින සවස් කාලයේ උඩවලව දෙමටගල ප්‍රදේශයේ සංබපාල රක්ෂිතය ගිනි ගැනීමකට ලක්ව ඇති බවට උඩවලව පොලිස් ස්ථානයට ලද

පණිවිඩයක් මත උඩවලව පොලිස් ස්ථානයේ නිලධාරීන් එම ස්ථානය වෙත ගොස් යුධ හමුදා කඳවුරේ නිලධාරින්ගේ, ගිනි නිවන ඒකකයේ නිලධාරින්ගේ සහ ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩපැවැත්වීමට කටයුතු කර ඇත.

මෙම ගිනි ගැනීම හේතුවෙන් අක්කර 30 පමණ භූමි ප්‍රදේශයක් විනාශ වී ඇති අතර ගින්න හේතුවෙන් ජීවිත හානි කිසිවක් සිදු වී නොමැත. ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර උඩවලව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**